# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**ආයතන චක්‍රලේඛ ලිපි අංක: 15/2015**

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07
2015 නොවැම්බර් මස 17වැනිදා

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

## උසස් අධ්‍යාපන ආයතන / ආයතන මගින් පවත්වනු ලබන අභ්‍යන්තර විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම

උසස් අධ්‍යාපන ආයතන / ආයතන මගින් පවත්වනු ලබන අභ්‍යන්තර විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීමේ දී සිදුවන ප්‍රමාදය සැලකිල්ලට ගෙන, අභ්‍යන්තර ( ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි) පරීක්ෂණයන්හි ප්‍රතිඵල, විභාගය පවත්වන ලද දින සිට මාස තුනක (03) කාලයක් ඇතුළත නිකුත් කළ යුතු බව කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

2. ඒ අනුව, පරීක්ෂණයේ ප්‍රතිඵල මාස තුනක කාලයක් ඇතුළත නිකුත් කිරීමට යටත්ව යථෝක්ත විභාග හා සම්බන්ධ පිළිතුරුපත් ඇගයීම සඳහා ගෙවීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස උසස් අධ්‍යාපන ආයතන / ආයතන ප්‍රධානීන්ට දන්වා සිටිනු ලැබේ.

3. ඉහත ප්‍රතිපාදන 2015.11.01 දින සිට ක්‍රියාත්මක වේ.

4. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත්:
1. ලේකම් / උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම් / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. ගණකාධිකාරී / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන් / සහකාර ලේඛකාධිකාරිවරුන්
12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන් / ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්
13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය : යූජීසී/එච්ආර්/6/02/04